කියැවුනේ , දහවල් කාලයේ ඔහුගේ සහායට ඉන්නා සගයා සහ අපේ රියදුරා මාරු වීමෙන්දෝයි මට සිතුනේ නොදැනිම මුවගට සිනා රැල්ලකුත් එද්දීය. අළුත්වැඩියාව අවසානයේ වෑන් රථයේ රියදුරු අසුනට ගොඩවී එය ටිකදුරක් එහාට මෙහාට පදවා පරික්ෂාවකට පවා ලක්කිරිමට අතපසු නොකළ ඔහු සාර්ථකව කටයුත්ත නිම කළ බව අපට දැන්වීය. " ඉක්මණින්ම දවසක ඕකෙ උඩ පොම්පෙන් වොෂර් මාරු කරන්න. නැත්තං යට වොෂර් දැම්මහම උඩ වොෂර් යනවා " ඔහු රියදුරාට වාහනයේ අනාගත සුභසිද්ධිය පිණිස අවාවාදයක්ද දිමට අමතක නොකළේය.

බෙහෙවින්ම ස්තූති පූර්වක බැල්මක් හෙළු අපේ රියදුරු තැන " ඔයාගේ ගාන කියද ?" යි ඇසුවේ මේ රෑ ජාමේ "අතිකාල" දීමනාවක්ද සමග විශාල ගාස්තුවක් ගෙවීමට නොවරදවාම සිදුවෙන බව සිතමින් බව අපට පෙනුනි. වෙන විකල්පයක් නැති කමින් ඕස්ට්‍රේලියාවේ විශේෂඥ වෛද්‍යවරයෙකු හමුවීමට ගොස් ඔහු ගෙන් ගාස්තුව විමසන පැන්ෂන් ගිය රෝගියෙකුගේ රුව මගේ සිතේ මැවිනි.

"ආ....." මඳක් කල්පනා කල කාර්මික ශිල්පියා "මේ වැඩේට රුපියල් 650 ක් ගන්නවා. හැබැයි ඉතිං ඔයගොල්ලොත් කරදරේ වැටිලා ඉන්න වෙලාවනේ පන්සියක් දෙන්න. ඒ ඇති " නිවුණු හඬින් පැවසීය. අපේ රියදුරා ඉමහත් සතුටින් ඔහුගේ අත කලිසමේ දකුණු සාක්කුවටත්, වම් සාක්කුවටත්, ඉන්පසු පසුපස සාක්කුවටත් යවමින් කලබලේ මුදල් සොයන බවක් මට පෙණුනි. බඩගින්නේ නිදිමතේ මෙන්ම මානසික ආතතියකින්ද සිටි රියදුරාට තම මුදල් ඇත්තේ කුමන සාක්කුවේ දැයි මතක නැති අයුරක් මට පෙනින.

"මචං , සල්ලි නැද්ද ? කමක් නෑ කමක් නෑ ඕගොල්ල යන්න." කාර්මික ශිල්පියාගේ හඬ මගේ දෙසවන තවමත් පිලිරුවි දෙයි. නොමිලේ විශ්ව විද්‍යාල අධ්‍යාපනය ලබාදී, රජයේ සහ බදු ගෙවන්නන්ගේ වියදමින් විශේෂඥ වෛද්‍යවරුන් බවට පත් වී, මහා කරුණාවෙන් රෝගීන් බලා කියා ගත යුතු යැයි අප බලාපොරෝත්තු වන " චැනල් වරයෙක්" ගෙන් වත් මෙවන් වදනක් අද ඇසිය හැකිද?. මේ මිනිස්සු දුප්පත් වී ඉපිද, දුප්පත් ලෙස ජිවත් වුවත්, අතිශයින්ම පොහොසත් , වංශවත් , වර්ණවත් සහ සුවඳවත් මනසකින් ජිවත්වන්නේ නොවේදැයි මම අවබෝධ කර ගතිමි. එකෙකු ඔහුගේ වාහනයේ කොටසක් අප වෙනුවෙන් ගලවා දීමට උත්සාහ කළ අතරේ තවෙකෙකු රාත්‍රී 10 න් පසුවී අකාලයේ ඔහු කළ " වෘත්තිමය" කටයුත්තට මුදල අයකිරිම පවා අමතක කර දැමීමට එක පයින් සුදනම්ය.

"නෑ නෑ , සල්ලි තියෙනවා " රියදුරාගේ හඬින් මා පිවිස සිටි කල්පනා ලොවින් පිටතට විසිවුණි . අතින් මුදල් සහ හදවතින් පින් ගෙවූ අප අපේ නවාතැනට ළගා වන විට රාත්‍රී 11 පසු වී තිබිණ.

කිසිදිනෙක නොලද ආකාරයේ විශ්මයාන්විත සතුටකින් හා ප්‍රබෝධයකින් නින්දට ගිය අප පසුද උදෑසන මහනුවර දළඳ සමිඳුන් වැඳපුරා ගෙන, දඹුළු විහාරය හරහා කලින් සැලසුම් කර නොතිබුණු මිහින්තලය බලා පිටත්වුයේ කලින් ද අත්දුටු උත්තරීතර සමාජ විඥද්ඥදණය අපට උරුම කර දීමට මුලික වු මිහිඳු මහ රහතන් වහන්සේ ලක්දිවට වැඩම කරවු ස්ථානය වැඳ පුද ගැනීම යුතුමක් නිසා විය යුතුය.

දෛවය විසින් කලින් දින රාත්‍රියේදී අපේ වන්දනා ගමනට මහත් අර්ථාන්විත භාවයක් එක් කළ බව නිසැකය. දුර රටක ඉපදී, අපේ අනගිභවනීය වුත්, උත්තරීතරවුත් ශ්‍රී ලාංකික සමාජ ව්‍යුහයෙන් ඈත් වී ජීවත් විමට සිදු වු අපේ දරු දෙදෙනා ගැන මට දැනුනේ මහත් දුකකි.

කුරිරු යුද්ධය නිසා සහමුලින්ම පිරිහී ඇතැයි අප කවුරුත් සිතා සිටි චිත්ත සන්තාන, නොසිතූ විරූ අයුරු උතුම් ස්වරූපයක් ගෙන ඇත. මෙය නම් අපූර්ව සමාජයකි. එහි ඉපදීමට තරම් වාසනාවන්ත වු අප, එහි ජිවත් නොවිමට තරම් අවසානාවන්ත වී ඇත.

සම්පත් ඉදිරියේ අන්ධයින් මෙන් දණ නමන කෲර, "ගෝලීය" සමාජයේ නුතන අරටුව තුළ අසරණව ජීවත් වුවත්, තවමත් හදවතින්ම මිනිස්කමත් , යුතුකමත් මුදලට වඩා අගයක අහිංසක උතුම් මිනිසුන්ට මේ සටහන උපහාරයක්ම වේවා.

(මෙහි එන සමහර පුද්ගල නාම පමණක් මනඃකල්පිතයි)

■




YSL
Migration Services

MIGRATION
SERVICES

We specialise in

Skilled Migration
State Sponsorship
Parent, Spouse and Student Visa

Yashodhara Sarachchandra Liyanaarachchi
(Registered Migration Agent)
MARN: 0746956

0430 359 006

26 Sallybrook Circuit, Narre Warren, VIC 3805
Tel: 03 8794 9818 | 03 8794 9297 :Fax

yasho@yslmigration.com
www.yslmigration.com

Lead Design House

MIGRATION AGENT REGISTERED mara.com.au REGISTRATION NUMBER 0746956

MIA
MEMBER OF MIGRATION INSTITUTE — OF AUSTRALIA —